**කොළඹ විශ්වවිද්‍යාලය**

**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී උපාධි දෙවන වසර (මාර්ගගත) පරීක්ෂණය**

**දෙවන සෙමෙස්තරය - 2019/2020**

**BST 2226 – සාහිත්‍ය මූලාශ්‍රය හා බෞද්ධ සම්ප්‍රදාය**

**විවෘත ග්‍රන්ථ ලිඛිත පරීක්ෂණය**

- කාලයඃ පැය 24 ක් තුළ පිළිතුරු සම්පූර්ණ කොට පිළිතුරු පත්‍රය LMS වෙත උඩුගත කළ යුතුය.
- ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු (ලකුණු 20 බැගින්) හිමිවේ.
- එක් ප්‍රශ්නයකට ඔබගේ පිළිතුරු **වචන 1000කට** නොවැඩි විය යුතුය.

---

1. අමාවතුර කතුවරයා බෞද්ධ සාහිත්‍යයෙන් තෝරා ගත් කතා පෙළ ගැස්වූ ආකාරය පැහැදිලි කොට, අරමුණට ගැළපෙන පරිදි ඒ කථා ඉදිරිපත් කළ ආකාරය එක් කථාවක් ඇසුරෙන් විමසන්න.

2. "ජාතකට්ඨකථා සිංහලට නැගෙන්ට පෙර ද ජන ආකල්ප යහපත් මාවතකට යොමු කිරීමට ජාතක කථා ඉවහල් කර ගනු ලැබිණ." ඒ කාලයට අයත් ග්‍රන්ථ ඇසුරින් මේ කියමන සාකච්ඡා කරන්න.

3. "පුරාණ සිංහල සමාජයේ බෝධි වන්දනාව ක්‍රියාත්මක වූ ආකාරය සිංහල බෝධිවංශය පැහැදිලි කරයි" විමසන්න.

4. බෞද්ධාගමික සංකල්ප ස්ථිරසාර ලෙස සමාජගත වීමට සද්ධර්මරත්නාවලිය හේතු වූ ආකාරය පැහැදිලි කරන්න.

5. කතිකාවත් පිහිටුවීමේ අරමුණු පැහැදිලි කොට එක් කතිකාවතක් උපයෝගී කරගෙන භික්ෂු ශාසනය හා ගිහි සමාජය අතර පැවති සම්බන්ධතාව නිරීක්ෂණය කරන්න.

******************************